# උත්ථාන සමයේ සත්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 20: 17-27

**"සුබාරංචියට සාක්ෂි දීම නිමකර**
**මාගේ මෙලෝ ගමන අවසන් කරමි."**

පාවුලු මිලේතසයෙන් එපීසියට පණිවුඩ යවා සභාවේ මූලිකයන් කැඳෙව්වේ ය. ඔවුන් තමා වෙතට ආ කල ඔහු මෙසේ පැවසී ය. "මා ආසියාවට පැමිණි පළමුවැනිදා පටන් මුළු කාලය ඔබ සමඟ ගත කළ සැටි ඔබ දන්නහු ය. මම සියලු ආකාර යටහත් පහත්කමින් ද ශෝකයෙන් ද ජුදෙව්වරුන්ගේ උපායයන් නිසා පැමිණි දුෂ්කරතාවලින් ද යුක්තව ස්වාමින් වහන්සේට සේවය කළෙමි. ඔබට වැඩදායක වූ කිසිවක් කීමෙන් නොවැළකී ප්‍රසිද්ධියේ ද ගෙයින් ගෙට යමින් ද ඔබට උගන්වමින් මනස්ථාපනයෙන් දෙවියන් වහන්සේ වෙත හැරෙන ලෙසත්, අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරන ලෙසත් ජුදෙව්වරුන්ට හා අන්‍ය ජාතිකයන්ට තදින් අනුශාසනා කළෙමි. දැන් ඉතින් ආත්මයාණන් විසින් බලපානා ලදුව , මම ජෙරුසලමට යමි. එහිදී මට කුමකින් කුමක් වේදැයි නොදනිමි. එහෙත් සිරගතවීම් හා පීඩා ද මට පැමිණේ ය යි ශුද්ධාත්මයාණන් වහන්සේ සියලු නගරවලදී දැනුම් දුන් බව හැර අන් කිසිවක් නොදනිමි. එහෙත් මාගේ ජීවිතය වැදගත් ය. නොහොත් මට ම අගේය කියා මම කිසිසේත් නොසලකමි. එහෙත් මාගේ පරමාර්ථය වූ කලී දෙවියන් වහන්සේගේ කරුණාවේ සුබ අස්නට සාක්ෂි

දීමෙන් ස්වාමින් වන ජේසුස් වහන්සේ ගෙන් මට පැවරුණු දූත මෙහෙය සපුරාලීම ය.

මේ වනතෙක් මම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන දේශනා කරමින් ඔබ අතර ගැවසුනෙමි. දැන් ඉතින් මින්පසු ඔබගෙන් කිසිවකු මගේ මුහුණ තවත් නොදකින බව දනිමි. එහෙයින් ඔබ අතරෙන් කිසිවකු විනාශයට පත් වුවහොත් ඒ ගැන මා වගකිවයුත්තකු නොවන බව තරයේ ප්‍රකාශ කරමි. මන්ද දෙවියන් වහන්සේගේ මුළු අභිප්‍රාය නොවළහා ඔබට ප්‍රකාශ කළෙමි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 68: 9-10, 19-20

පිළිතුර: මුළු ලොවෙහි රාජ්‍යයෙනි, දෙවිඳුන් හට ගායනා කරන්න.

ගීය:

අහෝ දෙවිඳුනි ඔබ බහුලව වැසි වස්වන සේක. ඔබේ උරුමය මැලවී යනවිට ඔබ එය යළි සාරවත් කළ සේක.
ඔබේ සෙනග එහි පදිංචි වූහ. අහෝ දෙවිඳුනි එහි දිළිඳුන් හට වුවමනා දේ ඔබ සපයා දුන් සේක.

දවසින් දවස අපේ බර උසුලන සමිඳුන් හට පැසසුම් වේවා!
එතුමාණෝ අප ගලවන දෙවිඳාණෝ වන සේක.
අපේ දෙවිඳාණෝ අප ගැලවුම්කාර දෙවිඳාණෝ වන සේක.
අප මරණින් මුදන දෙවි සමිඳාණෝ වන සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මම පියාණන් කෙරෙන් නික්ම ආවෙමි. ලෝකයට පැමිණ සිටිමි.
මම නැවත ලෝකය අත්හැර පියාණන් වහන්සේ වෙතට යන්නෙමි"
යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 17: 1-11

**"පියාණෙනි, ඔබ වහන්සේගේ පුත්‍රයාණන් මහිමයට පැමිණෙව්ව මැනව."**

ජේසුස් වහන්සේ මේ දේවල් වදාරා ස්වර්ගය දෙසට ඇස් ඔසවා මෙසේ යාච්ඤා කළ සේක. "පියාණෙනි, දැන් නියමිත මොහොත පැමිණ තිබේ. පුත්‍රයාණන් විසින් ඔබ මහිමයට පමුණුවනු ලබන පිණිස ඔබ ද පුත්‍රයාණන් මහිමයට පැමිණෙව්ව මැනව. මන්ද, ඔබ විසින් පුත්‍රයාණන්ට දෙන ලද සියල්ලන් හට සදාතන ජීවනය දෙන පිණිස සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආධිපත්‍යය ඔබවහන්සේ පුත්‍රයාණන්ට දුන් සේක. සදාතන ජීවනය මෙය. එකම සැබෑ දෙවියන් වන ඔබ ද, ඔබ විසින් එවන ලද තැනැත්වහන්සේ වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ද දැන ගැනීමය. ඔබවහන්සේ මට භාර දුන් මෙහෙය සම්පූර්ණ කරමින් මම මිහිපිට ඔබ

මහිමයට පැමිණෙව්මි. ඉතින් පියාණෙනි, ලොව ඇති වන්නට පෙර ඔබ හා සමඟ මට තිබුණු තේජශ්‍රීයෙන් දැන් ඔබ ඉදිරියෙහි මා තේජශ්‍රීයට පැමිණෙව්ව මැනව. ඔබවහන්සේ ලෝකයෙන් වෙන් කොට මට දුන් මිනිසුන් හට ඔබගේ නාමය මම ප්‍රකාශ කළෙමි. ඔව්හු ඔබට අයිති වූහ. ඔබ ඔවුන් මට දුන් සේක. ඔව්හු ඔබගේ දහම පිළිපැද්දාහ. ඔබ මට දුන් සියල්ලම ඔබගෙන් පැමිණි බව ඔව්හු දනිති. මන්ද ඔබ මට පැවසූ වචන මම ඔවුන්ට පැවසීමි. ඔව්හු එය පිළිගෙන මා ඔබ වෙතින් පැමිණි බව සැබැවින්ම දැන ඔබ මා එවා වදාළ බව විශ්වාස කරති"

"මම ඔවුන් උදෙසා යාච්ඤා කරමි. ඔබ මට දුන් ඔවුන් උදෙසා මිස, ලෝකය උදෙසා යාච්ඤා නොකරමි. මන්ද, ඔව්හු ඔබගේ ය. මා සන්තක සියල්ල ඔබගේ ය. ඔබ සන්තක සියල්ල මාගේ ය. ඔවුන් තුළින් මම තේජශ්‍රීයට පැමිණ සිටිමි. මම තවත් ලෝකයේ නොසිටිමි. එහෙත් ඔව්හු ලෝකයෙහි සිටිති. මම ඔබ වෙතට එන්නෙමි. සුවිශුද්ධ පියාණෙනි, අප මෙන් ඔවුන් ද ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් ඔබගේ නාමයේ අනුහසින් ඔවුන් ආරක්ෂා කළ මැනව.

සුවිශේෂ වාක්‍යය එසේය.